ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D


*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

පරිගණක කටයුතු : චන්න ලොකුලියන
*Computer Graphics* : Channa Lokuliyana

ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## මහ රැජිණ දිනේවා!
## Long live the Queen !

**දෙ**වන එලිසබෙත් මහරැජිණ බ්‍රිතාන්‍ය අධිරාජිණිය ලෙස ඔටුණු පළඳා මේ මාසයට වසර හැටක් ගතවිය. එය සැමරීමට අති විශාල 'දියමන්ති ජයන්ති' උත්සවයක් ගිය සතියේ මෙහි පැවැත්විණ. මෑත යුගයේ ලක්‍ෂ ගණනක ඒසා විශාල ජන සමූහයක් බකිංහැම් මාළිගය අසලටද ලන්ඩනයේ වීදිවල ද වෙනත් ප්‍රධාන නගරවල ද කිසියම් උත්සවයක් සඳහා රැස් වූ මේ දෙවන වතාවය. මින් පෙර එනම් මීට වසර **10** කට පෙර පැවති රැජිණගේ ස්වර්ණ ජයන්තියට ද මෙවන් ජනකායක් මෙසේ ම සහභාගි වූ අයුරු අපට මතක ය.

අතීතයේ බ්‍රිතාන්‍යය අපේ රට අල්ලා ගෙන යටත් විජිතයක් හැටියට පාලනය කරමින් අපේ රට සූරා කෑ අන්දම මට අමතක නොවේ. අපේ ජනයා සිංහලේ නිදහස පතා සටන්කරමින් දිවිපිදූ ආකාරයත් ඒ යුගවල දී ඔවුන් අනේක විදේශ ආක්‍රමණිකයින්ගේ අතවර යන්ට පීඩාවන්ට ගොදුරුවූ හැටිත් මම නිතර මෙනෙහි කරමි. ඉතිහාසය අමතක කළ යුතු දෙයක් නොවේ. එහෙත් සුද්දන් දෙස වෛරයෙන් යුතුව බැලීම අප බොහෝදෙනා අමතක කර බොහෝ කල්ය. එය එසේ විය යුතු ය.

බ්‍රිතාන්‍ය මහ රැජිණට හෝ රජ පවුලට හෝ විශේෂිත භක්තියක්, ආදරයක්, ගෞරවයක් මගේ නැත. එහෙත් අද මම එංගලන්තය මගේ දෙවන රටසේ සළකා මෙහි වෙසෙමි. මා දැන් බැඳී සිටින්නේ මේ නීති පද්ධතියට ය. මා ජීවත්වන්නේ මෙහි ය. මා ගරු කළත් නැතත් මේ එලිසබෙත් රැජිණ මගේ රැජිණ ලෙස ද සලකන්නට මට සිදුව තිබේ.

එලෙසම සෙවනට කිසියම් ගසක් යට සිටිනවා නම් ඒ ගසට පරිභව කරමින් ඒ ගසේ අතු කඩාදමන සිරිතක් මගේ නැත. එය මා උගත්තේ මගේ මව්බිමෙනි. එහි මගේ දෙමාපිය, ගුරුවර, වැඩිහිටියන් ආදීන්ගෙනි. ගමේ පන්සලේ හාමුදුරුවන්ගෙනි.

රජ පවුල නඩත්තුවට විශාල මුදලක් වාර්ෂිකව වැයවේ. ඒසා මුදලක් වැයකොට අභිමානය සඳහාම රාජත්වය තිබිය යුතු ද? රජ පවුල අහෝසිකළ යුතුයයි මෙහි ඇතැම් බ්‍රිතාන්‍ය වැසියන්ගෙන් හඬ නැගෙන්නේ වසර ගණනාවක සිට ය. එහෙත් බ්‍රිතාන්‍යයට රජ පවුල ඇතුවත් බැරි ය. නැතුවත් බැරි ය.

කොතරම් බැන්නත් ඔව්හු තම රැජිණ පාවා නොදෙති. ලක්‍ෂ ගණනින් තම රැජිණගේ දියමන්ති ජුබිලියට පැමිණියේ ඒනිසාය. ඒ දවස ඔවුන්ගේ ද අභිමානය බව සිතන නිසා ය. ඔවුනට රැජිණක් සිටින නිසා ය.

අපේ රට ශ්‍රීලංකාව රජවරුන් රැජිණන් **174** ක් පාලනය කළ රටකි. එහෙත් ඒ රජවරුන්ගේ අගයක් අප බොහෝ දෙනෙකුට තිබුණිද? ලොව වෙනත් කිසිම ජාතියක් විසින් නොකරන ලද, කරන්නට සිහිනෙන්වත් නොසිතන, ඉතා නිහීන තුච්ච දෙයක් සිංහලයෝ කළහ. එනම්, සිංහලයෝ තමන්ම ගොස් තමන්ගේම රජු අල්ලා පිටින් ආ සතුරන්ට පාවා දී තාන්න මාන්න ලැබූහ. එය අපේ ඉතිහාසයේ ද, අපේ හිතේ ද කිසිදාක මැකිය නොහැකි සේ වැටුණු මහා කලු පැල්ලමක් නොවේද?

# මිහිඳු හිමියන් අපට දායාද කළ අධ්‍යාපන ක්‍රමවේදය

***කලින් අධ්‍යාපන සේවා අමාත්‍ය***
***වර්තමාන වරාය සහ මහා මාර්ග අමාත්‍ය***
**නිර්මල කොතලාවල විසිනි**

**ස**ම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 200 කට පසුව පොසොන් පුර පසළොස්වක පෝදා ශ්‍රීලංකාවට වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රේෂ්ඨ අධ්‍යාපන වේදියෙකි. මානව ඉතිහාසයේප්‍රථම ලේඛන ගත බුද්ධි පරීක්‍ෂණය ලෙසින් දැක්වෙන්නේ මිහිඳු මාහිමියන් ගේ ඒ අධ්‍යාපන ක්‍රමවේදයේ සමාරම්භක සිහිවටන යයි. අඹ පැනය හා ඥාති ප්‍රශ්නය මගින් ලංකාවේ රජු අමතා ජාතියේ බුද්ධිය විමසූ උන්වහන්සේ ප්‍රඥාවන්තයින් සඳහා වූ අති සියුම් ගැඹුරු බුදුදහම සමගින් සූසැට කලාවක් රටට දායාද කළහ.

ජාතියක් ලෙස ශ්‍රීලාංකික අපට ලෝකයා ඉදිරියේ අභිමානයෙන් නැගී සිටින්නට ශක්තිය ලැබුණේ මිහිඳු හිමියන් මෙරට දියත් කළ සාර්ථක අධ්‍යාපන ක්‍රමවේදය නිසාය. ශ්‍රේෂ්ඨ සංස්කෘතියක්, ක්‍රමවත් භාෂාවක්, ජීවන දර්ශකයක් හා අද්වීතීය කලාවක් ආදී බොහෝ දේ අපට උරුම වූයේ මිහිඳු හිමියන් නිසාය.



*මුව දඩයමේ මිහින්තලා වනයේ මුවෙකු ලුහුබැඳ ආ දෙවනපෑතිස් රජතුමා දුනු හී බිම දමා මිහිඳු හිමියන් අබියස බුදුන් සරණ ගියේය.*

ලෝකයේ ශ්‍රේෂ්ඨතම ගුරුවරයා වන බුදුන්වහන්සේට පමණක් දෙවැනි වන අනුබුදු යන නාමය බෞද්ධ ලෝකයෙන් උන්වහන්සේට හිමි වූයේ එබැවිනි.

යුරෝපීය ආක්‍රමණිකයන් විසින් මෙරට පැවති පෝෂිත සංස්කෘතිය විනාශකර දමනතෙක් වසර 2500 ක් අපේ සාඩම්බර උරුමය පෝෂණය වී තිබුණේ මිහිඳු මහරහතන් වහන්සේ අපට ගෙනැවිත් දුන් මා හැඟි අධ්‍යාපනයෙනි. එම ක්‍රමවේදය අමානුෂික ලෙස අපෙන් උදුරා විනාශකළේ අපේ අනන්‍යතාව, අපේ දියුණුව හා පෞඨත්වය එහි මැනවින් රැකී තිබුණු නිසාය. විදේශ බලවේග විටින් විට තම අපේක්ෂා ඉටු කර ගැනීමට සමත් අධ්‍යාපන ක්‍රමවේදයක් අප වෙත බලෙන් පැටෙව්වත් ඉන් අප ලැබූ දියුණුවක් නැති තරම්ය.

එහෙත් අදත් අපට අපේ කියා සිහිකිරීමට ඉතිරිව ඇත්තේ මිහිඳු හිමියන් දායාද කළ, එම දායාදයේ අනුහසින් ගොඩනැගූ මාහැඟි නිර්මාණවල සාඩම්බර සිහිවටනයන්ය. මිහිඳු මා හිමියන් ගොඩනැංවූ අපේ අතීත අධ්‍යාපන ක්‍රමවේදය ජාතික අවශ්‍යතා සපුරාලීමට සමත් සංවිධානාත්මක ක්‍රමවේදයක් මගින් ආරම්භ වූවකි. අද වුවද සෑම රටකම සංවර්ධනයේ පදනම වී ඇත්තේ හා අධ්‍යාපනයෙන් ළඟාවීමට අපේක්ෂිත ඉලක්කය වී ඇත්තේ ජාතික අවශ්‍යතා සපුරාලීමයි.

මිහිඳු හිමියන්ගේ අධ්‍යාපන ක්‍රමවේදයේ පදනම යහපත් විනයගරුක පරපුරක් ඇතිකරලීම, ආර්ථික ස්ථිරත්වය හා කාර්යක්‍ෂමතාව ඇතිකිරීම මත ගොඩනැගුණකි. එය කොතරම් ක්‍රමානුකූලව හා මනා සංවිධානයකින් යුතුව ගොඩනැගුණේද යන්න අටුවා ග්‍රන්ථ වලින් පැහැදිලි වෙයි. අනුරාධපුර රාජධානි සමයේ පමණක් විශේෂඥභාවය ලද ආචාර්‍ය කණ්ඩායම් 18 ක් සිටි බව සඳහන්වේ. ඔවුන් විසින් බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ අධ්‍යාපනය දියුණු කිරීමටත්, රටේ ජනතාවට අවශ්‍ය අධ්‍යාපන ඥාණය ඉතා උසස් අයුරින් ලබාදීමටත් සමත් පුළුල් අධ්‍යාපනික සංවිධානයක් ඇතිකරගන්නා ලදී. එකල සෑම විහාරස්ථානයක්ම අධ්‍යාපන ආයතනයක් විය. එමගින් ගිහි අධ්‍යාපනයට අවශ්‍ය ආයුර්වේදය, නක්‍ෂත්‍රය, ගෘහනිර්මාණ ශිල්පය, ගණිතය, ඉතිහාසය වැනි විෂයයන් ආරම්භ කළ අතර ඒවා ක්‍රමයෙන් පුළුල් අධ්‍යාපනික විෂය මාලාවක් උගන්වන විද්‍යාස්ථාන ලෙස දියුණුවීය. ඒ ලද අධ්‍යාපනය මගින් සිත්පිත් නැති කළුගල්වලට බුදුන්වහන්සේගේ මහා කරුණාව, මහා ප්‍රඥාව, සමාධිය ජීවගුණයන් ලෙස කාවැද්දීමට සමත්විය. මහා සමුදුර පරදවන වැව් ඉදිවිය. අහස උසට මහදාගැබ් ඉදිකෙරිණ. ලෝවාමහාපාය වැනි මාහැඟි ගෘහනිර්මාණ ශිල්පයන් සමග ලොව මවිතකරවන වාරි කර්මාන්ත ඉදිවිය. ඊට අවශ්‍ය ඉන්ජිනේරු ශිල්ප ඥානය ලබාගැනීමට ආරම්භ කළ බෞද්ධ අධ්‍යාපනය හැර වෙනත් ක්‍රම තිබුණේ නැත.

එසේම එම ක්‍රමවේදය ජාතික වශයෙන් මහා පිබිදීමක් ඇතිකරන්නට සමත්විය. නිරවුල් චින්තනයක් ඇති කිරීම, කරුණාව, දයාව, අවංකත්වය, සමානාත්මතාව, නිර්ව්‍යාජත්වය, සරල බව වැනි මානව ගුණාංගයන්ගෙන් පිරිපුන් නිරෝගී ශක්තිමත් පුරවැසියන් බිහිකරලීම ඉන් මැනවින් සිදුවිය.

නූතන අධ්‍යාපනවේදීන් පෙන්වා- දෙන පරිදි රටක සංවර්ධනයට අධ්‍යාපනය, සංස්කෘතිය, දේශපාලනය, ආර්ථිකය හා ජනමාධ්‍යය එක් දිශාවකට ගමන් කළ යුතුය. අනුබුදු හිමියන් දියත් කළ අධ්‍යාපන ක්‍රමවේදයෙන් එවකට පැවති සියළුම ජාතික බලවේග සංවර්ධනය ඉලක්ක කරගත් එක් දිශාවකට ගමන්කරවූ බව පැහැදිලි ය.

***අම්බස්තල මුදුණේ සිට තිස්ස තිස්ස යයි ඇමතූ කල්හි නැවතී ඒ දෙස බැලූ පෑතිස් රජුට මිහිඳු මා හිමියෝ මෙසේ පැවසූහ.***

**" සමණාමයං මහා රාජ**
**ධම්ම රාජස්ස සාවකා**
**තමේව අනුකම්පාය**
**ජම්බුදීපා ඉධා ගතා "**

**" මහරජතුමනි අපි ධර්මරාජා වූ බුදුන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. ඔබට අනුකම්පා පිණිස ජම්බුද්වීපයේ සිට මෙහි පැමිණියෙමු. "**

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතෝපදේශයෙන්

ප්‍රාක් පාදයො: පතති බාදති පෘෂ්ට මාංසං
කර්ණෙ කලං කිමපි රෞති ශනෙර් විචිත්‍රම්
පිද්‍රං නිරූප්‍ය සහසා ප්‍රවිශත්‍ය'ශංක
සර්වං බලස්‍ය චරිතම් මශක: කරොති

*අර්ථය : පළමුකොට දෙපා සමීපයේ (අවනතව) වැටේ. පිටමස් කයි. (අනර්ථයක් කරයි.) කණ සමීපයේ මනොඥවූ, විසිතුරු වූ, මිහිරිවූ කිසියම් ශබ්දයක් (කිසි නොකිය යුත්තක් හෙමින් කියයි) කරයි. කිසියම් වැරැද්දක් නමැති සිදුරක් සොයා සැක රහිතව වහා විදියි. (අමාරුවේ හෙළයි. විනාශ කරයි.) මේ අනුව මදුරුවා දුර්ජණයාගේ සියළු චරිතය විදහා දක්වයි.*

**මෙ**ම පද්‍යයේ උපමා උපමේය වශයෙන් යොදා ඇත්තේ දුදනා හා මදුරුවා යන දෙදෙනාය. දුදනෙකුගේ සියළු ක්‍රියාකාරකම් මෙහිදී මදුරුවෙකුට උපමා කොට ඇත.

කවුරුත් දන්නා පරිදි මදුරුවා හැමදෙනටම කරදරකාරී, පීඩාකාරී එමෙන්ම දෂ්ට කළ පසු වේදනා ගෙන දෙන, එලෙසම විනාශකාරී ලෙඩ රෝග බෝකරන රෝගකාරකයෙකි. අනුන්ගේ ලෙයින් ජීවත්වන මදුරුවා පරපෝෂිත දරුණු මැසි වර්ගයකි.

මිතුරු වෙසින් පෙනී සිට මිතුරන්ගෙන් ප්‍රතිලාභ ලබමින් ඔවුන්ගේ සුළු හෝ අඩුපාඩුවක් දුටු සැනින් යටි උගුල් අටවා ඔවුන් විනාශ කිරීමේ සමත් මිත්‍ර ප්‍රතිරූපකයින් (මිතුරන් ලෙසින් පෙනී සිටින්නන්) හඳුනාගන්නා ලෙස මෙම උපදේශ කාව්‍යයෙන් පෙන්නා දෙනු ලබයි.

අප ලෝකයේ කොහෝ ජීවත් වුවද මිතුරන්ගෙන් තොරව ජීවත්විය නොහැකි ය. ඒ තරම්ම මිතුරන්ගේ අවශ්‍යතාව දැඩිව අප සැමට බලපාන හෙයිනි. දෙමාපිය, සොයුරු, නෑ සබඳතා හැරුණ විට ඊළඟට කෙනෙකු සතු දැඩි බැඳීම මිතුරුදමයි. සමහර විට එම මිත්‍රධර්මය මුලින් සඳහන් කළ බැඳීම් වලටත් වඩා දැඩිවන බව අප කවුරුත් දන්නා කරුණකි. බාල තරුණ මහළු කාටත් එකසේ මෙම මිතුරන් ආශ්‍රය කිරීමට ලැබේ. අඩු වශයෙන් එක මිතුරකු හෝ නොමැති කෙනෙකු මෙලොව සොයා ගැන්ම උගහටය. නමුත් අමාරු කරුණ වන්නේ යහපත් අවංක මිතුරෙකු සමාජයෙන් සොයාගැනීමයි. සංකීර්ණ සමාජවල දිවි ගෙවන ඔබට දූෂිත මිතුරන් එමට හමුවෙනවා ඇත. නමුත් එම මිතුරන් අතරින් සබෑ මිතුරෙකු සොයාගැන්ම කොතරම් අසීරුද? හේතුව උඩින් බැලූ බැල්මට හොඳින් සිටියත් බොහෝ දෙනා සමාජ සාරධර්ම හා අගයන්ගෙන් තොර වංක ජීවන රටාවක් ගතකරන හෙයිනි.

මිනිස් ජීවිතයේ උදාරත්වය රැකෙන පරිදි ධර්මානුකූලව ජීවිත ගතකරන පිරිස ඉතා විරල ය. උසස් මිතුරුදම් අගයන මනා සංකල්පනාවන්ගෙන් යුතු පිරිපුන් පුද්ගලයින් අපට හමුවන්නේ ඉතා අහඹු ලෙසිනි. අන්‍යොන්‍ය බැඳීම හා ගැඹුරු අවබෝධය මිතුරන් සතු වටිනා ගුණධර්මයන්ය. කෙනෙකුට ඇතිවන්නාවූ දුක් කරදර වලදී අත් නොහැර හිඳීම හොඳ මිතුරෙකුගේ ස්වභාවයයි. මිතුරුවී ලාභ ප්‍රයෝජන ලබා පහසුවෙන් නොමග යැවිය හැකි පුද්ගලයෙකු නම් චාටුවෙන් ඔවුන් රවටා විපතේ හෙළීම පවිටු මිතුරෙකුගේ ස්වභාවයයි.

වහා කිපෙන්නන්, බලයට ගිජුවූවන්, බියපත්වූවන්, අහංකාරවූවන් හා ධනයට කෑදර අය සාමාන්‍යයෙන් මිත්‍ර ප්‍රතිරූපකයන්ගේ වසඟයට හසුවේ. එම දුර්වලතාවන්ගෙන් යුතු අය පහසුවෙන් රැවටෙන හෙයින් පහසුවෙන් අමාරුවේ හෙළිය හැකියි. ප්‍රමාණයෙන් කුඩා වුවද මදුරුවාගේ දරුණු බව හඳුනාගෙන ඔවුන්ගෙන් ප්‍රවේශම් වන්නාසේම මිතුරන් අතරින් කළණ මිතුරාත් මිතුරු වෙස්ගත් හතුරාත් තෝරා බේරා ගැන්මේ වගකීම හා භාරදූර කාර්යය තම තමන් සතුය.



***♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
***ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරය***
***ඔක්කම්පිටිය මොනරාගල***
**Sri Lanka**

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**